# වාරිමාර්ග අමාත්‍යාංශය

## ඇබෑර්තු

# මහවැලි ජලසුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP)

## අරමුදල් ප්‍රභවය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)

2024 වසරේදී සම්පූර්ණ කිරීමට නියමිතව ඇති ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) සහන ණය පහසුකම් හා ශ්‍රී ලංකා රජයේ අරමුදල් භාවිත කරමින් වාරිමාර්ග අමාත්‍යාංශය මගින්, මහවැලි බහුකාර්ය සංවර්ධන වැඩසටහනේ ප්‍රධාන සැලැස්මේ කොටසක් වන මහවැලි ජලසුරක්ෂිතතා ආයෝජන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

**අයදුම්පත් :**

**ප්‍රසම්පාදන විශේෂඥ (PS 03)** තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමින්, යථා පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවන ලබන අතර, තම අයදුම්පත් අදාළ ජීවදත්ත සහ මූලික සුදුසුකම්, එනම්, අධ්‍යාපනික, වෘත්තීය හා පළපුරුද්දක් පිළිබඳ සහතිකවල පිටපත් සහිතව ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ විස්තර සමග, පහත සඳහන් ලිපිනය වෙත 2022.03.27 දිනට පෙර ලැබීමට සලස්වන මෙන් අයදුම්කරුවන් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ. අදාළ අයදුම්පත බහාලූ කවරයේ වම් ඉහළ කෙලවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. එයට අමතරව, ලංසුකරුවන් වෙතින් මෙම අයදුම්පතෙහිම සෑදූ පිටපතක්, hr.mwsip@gmail.com වෙත පිටපත් කොට pdadbproject@gmail.com වෙත ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටින අතර, අයදුම්කරනු ලබන තනතුර ඊමේල් පතෙහි විෂය හිරයේ සඳහන් කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන,**
**අංක 493 - 1/1, ටී. බී. ජයා මාවත, කොළඹ 10.**

| තනතුරු නාම හා රැකියා විස්තරය | සුදුසුකම් හා පළපුරුද්ද |
|---|---|
| 1. **ප්‍රසම්පාදන විශේෂඥ (PS-3) වැඩසටහන් කළමනාකරණ ඒකකය - කොළඹ.**<br>**තනතුරු 01**<br>**රැකියා විස්තරය**<br>පහත සඳහන් කරුණු ඇතුළත්ව, ව්‍යාපෘති පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම, පිළිබඳ සියලු අංග තුළ ණය අරමුදල්/ ප්‍රධාන ගිවිසුමේහි සහ හෝ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්මෙහි විස්තර කොට ඇති පරිදි ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් කළමනාකරණ ක්ෂේත්‍රයේ අදාළ තාක්ෂණික යෙදවුම් ලබාදිය යුතුය.<br>• වැඩසටහනට/ ව්‍යාපෘතියට අවශ්‍ය පරිදි වන ප්‍රසම්පාදන සේවා<br>• ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් කළමනාකරණය සම්බන්ධව ව්‍යාපෘති ක්‍රියාකාරකම් සම්බන්ධ කටයුතු කිරීම.<br>• වාරිමාර්ග / ජල සම්පත් ව්‍යාපෘති ඉදිකිරීම් රථ වාහන, යන්ත්‍රාගාර හා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ, ආදියට අදාළ වන ප්‍රමිතීන් හා පිරිවිතරයන් සකස් කිරීම.<br>• ක්ෂේත්‍රය තුළ ගැටලු ක්‍රියාත්මක විම විශ්ලේෂණය කොට විසඳීම.<br>• කොන්ත්‍රාත් කළමනාකරණයෙහි ගැටුම් විසඳීම හා ආරවුල් සමථයට පත්කිරීම.<br>• ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් කළමනාකරණ කටයුතුවලදී අනෙකුත් කණ්ඩායම් සාමාජිකයන් සමග සම්බන්ධීකරණයෙන්/ විමසීමෙන් කටයුතු කිරීම.<br>• වැඩසටහන් අධ්‍යක්ෂ විසින් පවරනු ලබන වෙනත් ඕනෑම කාර්යයක්. | • පහතින් දක්වා ඇති සුදුසුකම් පළපුරුද්ද හා වැටුප් තලයන්, අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව වේ.<br>1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම<br>**හෝ**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ වෙනත් සමාන සුදුසුකම්<br>**හෝ**<br>සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකම්<br>**සමග**<br>කළමනාකරණ තලයේ, සුදුසුකම් ලබාගත් පසු අවම වශයෙන් වසර 14 ක පළපුරුද්ද<br>2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම<br>**හෝ**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්<br>**හෝ**<br>සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකම්<br>**සහ**<br>සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික/ වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම්<br>**සමග**<br>සුදුසුකම් ලබාගැනීමෙන් පසු, කළමනාකරණ තලයේ, අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද,<br>3. රජයේ දීප ව්‍යාප්ත සේවයේ<br>I පන්තියේ නිලධාරියෙකු හෝ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ සමාන තනතුරක්<br>**සමග**<br>I පංතිය තනතුරක අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද<br>වැටුප් තලය : PS-3<br>රුපියල් 180,000.00 – රුපියල් 195,000.00 |

* අංක 01/2019 MSD චක්‍රලේඛය ප්‍රකාරව ඉහතින් නිර්දිෂ්ට වැටුපට අමතරව ජීවන වියදම් අංක දීමනාව ද ගෙවනු ලැබේ.

**පොදු කොන්දේසි :**

1) අයදුම්කරුවන් වයස අවුරුදු 62 ට අඩු විය යුතුය.

2) සියලුම නිලධාරීන්, තමන්ගේ රාජකාරි කටයුතු අදාළ රජයේ සංවිධාන හා අනෙකුත් නියෝජිතායතන සමග සහයෝගිතාවයෙන් හා සම්බන්ධීකරණයෙන් සිදුකිරීම අපේක්ෂා කෙරේ.

3) ශ්‍රී ලංකාවේ සිදුකළ විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල සේවය කොට ඇති පළපුරුද්ද තිබීම අමතර වාසියක වනු ඇත.

4) මෙම තනතුරු සඳහා, ඉංග්‍රීසි භාෂා ප්‍රවීණත්වය, රජයේ රෙගුලාසිවල හුරුපුරුදුතාවය හා පරිගණක සාක්ෂරතාවය අත්‍යවශ්‍ය පූර්වාවශ්‍යතාවයන් වේ.

5) සේවයේ යෙදවීමේ කොන්ත්‍රාත් වසර එකක් සඳහා වන අතර, කාර්යසාධනය හා වැඩසටහනේ / ව්‍යාපෘතියේ අවශ්‍යතාවය මත වාර්ෂිකව අලුත් කිරීමේ අවකාශ ඇත.

6) අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය හෝ යම් සංශෝධනය කිරීම් ප්‍රකාරව රජයේ අනුමත වැටුප් පරිමාණ හා දීමනා ගෙවනු ලැබේ. (http://www.treasury.gov.lk)

ඉහළම සුදුසුකම් හා පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අතර, තෝරා ගැනීම කුසලතා මත සිදුකරනු ලැබේ. එසේ හෙයින්, මෙම බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය යම් බලපෑම් සිදුකිරීම හෝ නියෝජනයන් සිදුකිරීම අයදුම්පත ප්‍රතික්ෂේප වීමට හේතු වන ඇත. රජයේ සේවයේ/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල/ සංස්ථාවල හා අනෙකුත් රජයේ ආයතනවල අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතු අතර, ඔහු විසින් මෙම තනතුරට අදාළ අයදුම්කරු තෝරාගනු ලැබුවහොත්, දැනට දරන තනතුරින් පූර්ණ කාලීනව නිදහස් කළ හැකි ද යන්න සඳහන් කළ යුතුය. ඉහත අවශ්‍යතා සම්පූර්ණ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

**ලේකම්,**
**වාරිමාර්ග අමාත්‍යාංශය.**